නමෝ බුද්ධාය

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක:180

ශ්‍රී. බු. ව. 2559 | 2015 ජූනි 02 | පොසොන් කළාපය

# බුදුරදුන්ට පමණක් හිමි වූ නුවණ සය

## අතිපූජ්‍ය මකුලෑවේ විමල නා හිමිපාණන් වහන්සේ විසිනි

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස ///

කිසිවෙකු හටත් නැති
මුනිඳුට සනුවණෙක් ඇති
මෙලොව සැමටම ඇති
වාසනා ගුණ කිසිවෙකුත් නැති

පින්වතුනි,

බුදුරජාණන් වහන්සේට පමණක් ඇති අන් කිසිම සත්වයෙකුට නොමැති, අන්‍ය සියලු ශ්‍රාවකයන්ගේ ඥානයන් හා සාධාරණ නොවූ ඥාණ හයක් ගැන ධර්මයෙහි සඳහන් වේ. ඒවා "ෂට් අසාධාරණ ඥාණ" නමින් හඳුන්වනු ලැබේ. බුදුරජාණන් වහන්සේට විනා අන් කිසිම කෙනෙකුට නොමැති මේ නුවණ සය, කිසිවෙකුට සාධාරණ නොවූ ඥාණ හයක් බව යි. වෑත්තෑවේ හිමියන් ඉහත සඳහන් කවියෙන් ප්‍රකාශ කරන්නේ,

බුදුරජාණන් වහන්සේ තුළ ඇති ඥාණ ශක්තිය අනෙක් සියලුම ඥාණයන් පරදවා ජය ගැනිමට සමත් ය. උන්වහන්සේගේ නුවණ සංඛත අසංඛත සියලු ධර්මයන් විෂයෙහි විනිවිද ගෙන පැතිර පවතී. එබඳු ශ්‍රේෂ්ඨ වූ බුද්ධ ඥාණයන් මේ පොසොන් සමයෙහි ස්වල්ප වශයෙන් නමුත් සිහි කිරීම බෞද්ධ අප කාහට වුවද ප්‍රයෝජනවත් වේ. බුදුරජාන් වහන්සේට පමණක් සාධාරණ වූ ඒ ඥාණ සය මෙසේය.

- **ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාණය**
- **ආසයානුසය ඥාණය**
- **යමක පාටිහාරිය ඥාණය**

- **මහා කරුණා සමාපත්ති ඤාණය**
- **සබ්බඤ්ඤුත ඤාණය**
- **අනාවරණ ඤාණය යනුයි**

ෂට් අසාධාරණ ඥාණයන්ගෙන් පළමුවැන්න **"ඉන්ද්‍රිය පරෝපරියත්ත ඤාණය"** යි. මෙහි ඉන්ද්‍රියෝ නම් ලොකවාසී සත්වයන් තුළ පවතින ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා යන මේ ධර්ම පහයි. (වෙනත් ස්ථාන වලදී ඉන්ද්‍රිය නාමයෙන් චක්‍ෂු, සොතාදිය දක්වා ඇතත් මෙහි ඉන්ද්‍රිය වශයෙන් ගෙන ඇත්තේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් ය.) මේ ඉඳුරන් කොතෙක් දුරට මෝරා තිබේද? ශ්‍රද්ධාදී මේ ඉන්ද්‍රිය ධර්ම මොහුට මෙතෙක් වැඩිය. මෙතෙක් අඩුය. යනාදී වශයෙන් හැම සතුන්ගේ උස්-මිටිකම් දැනගන්නේ මේ ඉන්ද්‍රිය පාරෝපරියන්ත ඥාණය මෙහෙයවා බැලීමෙනි. මේ ඥාණය මගින් මඳ කෙලෙස් ඇතියන් ද, බහුල කෙලෙස් ඇතියන් ද මාර්ග ඵලාවබෝධය කළ හැකි පුද්ගලයන් ද නොකළ හැකි පුද්ගලයන් ද විවිධ දෘෂ්ටීන්හි වෙළුණු ඒ ඒ සත්වයයන්ගේ කර්ම විපාක, ක්ලේශාවරණයන්ගේ තත්ත්වය යනාදිය ද මේ ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥාණය මෙහෙයවා උන්වහන්සේ දැන වදාරති.

**"අසායානුසය ඤාණය"** නම් නිවන් අවබෝධයට සුදුසු සත්වයන්ගේ ආසය-අනුසය පවත්නා හැටි විමසා බලන නුවණ යි. මෙහි ආසය නම් සිත් සතන්හි නිතර එක්රුස්ව පවතින, නවතින තැන යි. ශාස්වත උච්ජේදාදි විවිධ දෘෂ්ටීන් ද, කාම, ව්‍යාපාද, ථීන මිද්ධාදිය ද, සම්‍යග් දෘෂ්ටික අදහස් වූ නෙක්ඛම්මාදී අදහස් ද, සත්වයන්ගේ සිත් සතන්හි බෙහෙවින් ඇලුන, ලැගුණ අදහස් ය. යන තේරුමෙන් ආශය යයි කියනු ලැබේ.

අනුසය නම් අනුරූප කාරණයක් ලැබ ඉපිද මතු මත්තෙහි ලුහු බඳිමින් ශක්තිමත් බවට පැමිණ, අවස්ථා පැමිණ කල්හි, සුදුසු අරමුණක් ලත් කල්හි නැවත නැවත ඉපදීමට සුදුසු අකුසල ධර්මයෝ යි. අනුසය ධර්ම හතෙකි. කාමරාග, භවරාග, පටිඝ, මාන, දිට්ඨි, විචිකිච්ඡා, අවිජ්ජා වශයෙනි. සත්වයන් තුළ පවතින ආශය, චරිත ගතිගුණ අධිමුක්ති ආදියත් මේ අනුසය අවස්ථාවනුත් බුදුරජාන් වහන්සේට විනා අන් කිසිවෙකුට තත්වාකරයෙන් විමසා බැලිය නො හැකිය. බුදු ඇසින් මේ ආසය - අනුසය විමසා දැනගන්නා නුවණ අන් අයට නැති නිසා ආසායානුසය ඥාණය අසාධාරණ ඥාණයක් වේ.

**"යමක පාටිහාරිය ඤාණය"** නම් යමාමහ පෙළහර පෑමේදී උදව් කරගන්නා නුවණ යි. ප්‍රාතිහාර්යයෝ සෘද්ධි ප්‍රාතිහාර්ය, ආදේසනා ප්‍රාතිහාර්ය, අනුසාසනා ප්‍රාතිහාර්ය

යයි ත්‍රිවිධ වේ. නෙයෙක් සෘද්ධි ප්‍රාතිහාර්ය පෑම ඉද්ධි පාටිහාරය යි. සිත් සතන් පවතින හැටි මේ මේ යැයි කියා පෑම ආදේශනා ප්‍රාතිහාර්ය යයි. අවවාද අනුසාසනා ස්වරූප වූ ධර්ම දේශනා පැවැත්වීමෙන් හා සීල - සමාධි - ප්‍රඥා යන පිරිසිදු ප්‍රතිපත්තීන් ආදර්ශයෙන් ද පෙන්වා උපදෙස් දීම අනුශාසනී ප්‍රාතිහාර්ය යි. යමා මහ පෙළහර පෑමේදී එක්වර ක්‍රියා දෙකක් පෙන්වයි. උඩුකයින් ගිනි කඳ පවතින විට යටිකයින් දිය දහර පවතියි. වම් ඇසින් දිය දහර පිටවන විට දකුණු ඇසින් ගිනි කඳ පිටවෙයි. මෙසේ යමක පාටිහාරිය දැක්වීමේදී එක්වර ස්ථාන දෙකකින් ක්‍රියා දෙකක් කිරීමේ නුවණ ශ්‍රාවකයින්ට අසාධාරණ බුදුරජාණන් වහන්සේට ම සාධාරණ වූ නිසා අසාධාරණ ඤාණයක් වේ.

"**මහා කරුණා සමාපත්ති ඤාණය**" නම් දුකට පත් සත්වයන් ගැන මහා කරුණාව උපදවා ඒ දුකින් මුදවා ගන්නා නුවණ යි. බුදුරජාණන් වහන්සේ දිනපතා මහා කරුණා සමාපත්තියට සමවැද, සැම සතුන් දුකින් මුදාලන්නට සිතා බලන සේක. එසේ බලන විට සත්වයා රාගාදි ගිනි වලින් ද පීඩා ලබමින් දුක්වලට භාජන වී ඇතැයි දකින බුදුරජාණන් වහන්සේට ඒ සත්වයින් කෙරෙහි මහා කරුණාව පහළ වෙයි. එවිට උන්වහන්සේට "මම මේ සියලු දුකින් මිදුනෙමි. ඒ නිසා මම මේ සත්වයින් සියලු සසර දුකින් මුදවාලන්නට සමර්ථ වෙමි" යි දකින බුදුරජාණන් වහන්සේට සත්වයින් කෙරෙහි මහා කරුණාව ඇති වෙයි. මෙසේ සත්වයින් කෙරෙහි තත්ත්වය දැන ඇතිවන මහා කරුණාව **මහා කරුණා සමාපත්ති ඤාණය** නම් වේ.

"**සබ්බඤ්ඤුත ඤාණය**" නම් සංඛත - අසංඛත - පරමාර්ථාදී දත යුතු තාක් සියලු දේ දැන ගන්නා නුවණ යි. බෝධිසත්වයන් වහන්සේ දීපංකර පාද මූලයේදී නියත විවරණ ලැබ අධිෂ්ඨාන කෙළේද, "**සබ්බඤ්ඤුතං පාපුණිත්වා - සන්තාරෙස්සං සදෙවකෙ**" යි සර්වඥ බවට පැමිණ දෙවියන් සහිත ලෝකයා සසරින් එතෙර කරවමි යන අධිෂ්ඨානය යි. සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් මුලුල්ලෙහි දසපාරමී සම්පූර්ණ කෙළේද මේ සබ්බඤ්ඤුත ඤාණය ලැබීම සඳහා යි. පිරූ පාරමී බලයෙන් අර්හත් මාර්ග ඤාණය සමගම සවාසනා සකල ක්ලේශයන් දුරුකොට සව්නේ දත් නුවණ හෙවත් සර්වඥතා ඤාණය අවබෝධ කරගත් සේක. ලෝකයේ දතයුතු යම් පමණ දෙයක් ඇත්නම් එපමණටම බුදු නුවණ ද ඇත. බුදු නුවණ යම් පමණ ද දතයුතු දෙය ද එපමණ ය. බුදු නුවණ දත යුතු දෙය කෙලවර කොට ඇත්තේ ය. දත යුතු දෙය බුදු නුවණ කෙලවරකොට ඇත්තේය. මෙයට සබ්බඤ්ඤුත ඤාණය යි කියනු ලැබේ. නව අරහාදී බුදු ගුණයන් අතරෙහි සම්මා සම්බුද්ධ පදයෙන් දැක්වුයේ ද මේ සර්වඥතා ඤාණය ම යි. සියල්ල දන්නා බව සබ්බඤ්ඤුතා යි. ඒ සඳහා පහළවන නුවණ **සබ්බඤ්ඤුත ඤාණය** යි.

මේ "**සර්වඥතා ඤාණය**" හා "**අනාවරණ ඤාණය**" ද නම් වශයෙන් දෙකක් වුවද, අවස්ථා වශයෙන් බලන විට එකක් කොට සලකනු ලැබේ. සියලු ලෞකික ලෝකෝත්තර ධර්මයන් නිරවශේෂයෙන් අවබෝධ කිරීම සර්වඥතා ඤාණය යි. එහි නොපැකිල පවත්නා නුවණ අනාවරණ ඤාණය යි. අතීත - වර්තමාන - අනාගත යන කාලත්‍රය පිළිබඳ සියල්ල දැනීම සර්වඥතා ඤාණය යි. එහි නොපැකිල පවත්නා නුවණ "**අනාවරණ ඤාණය**" යි.

මේ කරුණු අනුව බුදුරජාණන් වහන්සේගේ නුවණ සෑම දෙයක් ම සෑම අයුරකින් ම විනිවිද දකින්නට බලන්නට කොතරම් හැකියාවක් ඇද්දැයි පැහැදිලි වෙයි. මේ දැක්වූ බුදුරජාණන් වහන්සේට පමණක් සාධාරණ අන්‍යයන්ට සාධාරණ නොවූ ෂඩ් අසාධාරණ ඤාණ පිළිබඳ තොරතුරු විමසා දැනගැනීම අපේ ශ්‍රද්ධා ගෞරවය ආරක්‍ෂා වීමට මෙන්ම, බුදුගුණ හඳුනා ගැනීමටත් බෙහෙවින් ඉවහල් වේ. බුදුගුණ නිසි සේ දැන හඳුනා ගැනීම බුද්ධානුස්සති භාවනාව දියුණු කරගැනීමට ද බෙහෙවින් ඉවහල් වේ. එම්ම නිසා බොදුනුවන් විසින් තව තවත් මෙබඳු බුද්ධ ඤාණ පිළිබඳ දැන- ඉගෙන තම ධර්ම ඤාණය වඩ වඩාත් දියුණු කර ගැනීමට මේ පොසොන් සමයෙහි අධිෂ්ඨාන කර ගන්නා ලෙස කරුණාවෙන් මතක් කරමු.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**